# 8 මුදල් පොත සහ සුළු මුදල් පොත



මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

8.1 මුදල් පොත

j මුදල් පොත හැඳින්වීම
j මුදල් පොතේ ද්විත්ව කාර්යය
j මුදල් පොතේ ගනුදෙනු සටහන් කිරීම
j මුදල් පොත හා අනෙකුත් ගිණුම් තුලනය කිරීම
j මුදල් වට්ටම් සම්බන්ධ ගනුදෙනු සටහන් කිරීම

8.2 සුළු මුදල් පොත

j සුළු මුදල් අග්‍රිමය
j විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොත පිළියෙල කිරීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 8.1 මුදල් පොත

**වයාපාර ගනුදෙනු ආශ්‍රිත ව ව්‍යවහාර මුදලින් සිදුවෙන මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම් වාර්තා කෙරෙන මූලික සටහන් පොත මුදල් පොත වේ.**

**ව්‍යාපාරයකට මුදල් ලැබෙන මාර්ග හා ව්‍යාපාරය විසින් ගෙවීම් කෙරෙන මාර්ග විවිධ වේ.**

### ව්‍යාපාරයක මුදල් ලැබීම්වලට නිදසුන්

- අයිතිකරුගේ ප්‍රාග්ධනය ලෙස ලැබෙන මුදල්
- අත්පිට විකුණුම්වලින් ලැබීම්
- ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම්
- මුදල් ණයට ගැනීම්
- කුලී, පොලී, කොමිස් යනාදී ආදායම් සඳහා මුදල් ලැබීම්

### ව්‍යාපාර විසින් කරන මුදල් ගෙවීම්වලට නිදසුන්

- ණය ආපසු ගෙවීම්
- අත්පිට ගැනුම්
- ණය හිමියන්ට ගෙවීම්
- සේවක වැටුප්, විදුලිය ආදී වියදම් සඳහා ගෙවීම්
- ලී බඩු, යන්ත්‍ර ආදී ස්ථාවර වත්කම් මිලට ගැනීම සඳහා කරන ගෙවීම්
- අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් මුදල් ඉවත් කර ගැනීම්

මුදල් පොතෙහි ලැබීම් සටහන් කරන්නේ **ලදුපත** ආශ්‍රයෙන් වන අතර ගෙවීම් සටහන් කරන්නේ **ගෙවීම් වවුචර** ආශ්‍රයෙනි.

### ලදුපත

**ව්‍යාපාරයකට යම් මුදලක් ලැබුණ විට එම ලැබීම සනාථ කරමින් ව්‍යාපාර විසින් මුදල් ගෙවූ පාර්ශ්වය වෙත නිකුත් කෙරෙන කුවිතාන්සිය** ලදුපත ලෙස හැඳින්වේ. මෙහි අනු අංකයක් මුද්‍රණයකර ඇත. තවද, මුදල් ලැබුණු දිනය, ලැබුණු කාරණය, ලැබුණු මුදල යනාදී විස්තර ඇතුළත් කොට මුදල් භාරගත් පුද්ගලයා (අයකැමි) විසින් අත්සන් කොට මෙය නිකුත් කෙරෙයි. මුදල් ලැබීමේ කුවිතාන්සිය සහ මුදල් මැමය යන නම්වලින් ද මෙය හැඳින්වේ. ලදුපත ව්‍යාපාරයට මුදල් ලැබුණු බවට පවතින ලිඛිත සාක්ෂිය වේ.

ලදුපතේ පිටපතක් ගිණුම් අංශයට ලැබිය යුතු අතර එය මූලාශ්‍ර කරගෙන මුදල් ලැබීම් මුදල් පොතේ සටහන් කෙරෙයි. ලදුපත් ඒ ඒ ව්‍යාපාරයේ ස්වරූපය අනුව විවිධ ආකාරයෙන් පිළියෙල කෙරේ. මේ සඳහා වූ නිශ්චිත ආකෘතියක් නැත. සාමාන්‍යයෙන් ව්‍යාපාරයක් විසින් පහත සඳහන් ආකෘතියෙන් යුතු ලදුපත් භාවිත කළ හැකි ය. ඒවා නිරීක්ෂණය කරන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ලදුපත

අනුක්‍රමික අංකය :- 20513

අනෝමා පොත්හල,
82, අරලිය පාර,
මහරගම.
දුරකථන අංය :- 0112030278
දිනය .........................

.........................................................................................................................
අංක ..................... දරන ඉන්වොයිසිය සඳහා ලැබිය යුතු රු..................................
.................................................. මුදල චෙක්පතින්/මුදලින් ස්තුතියෙන් භාරගනිමි.

රු ................... ............................. ........................ ................................
පිළියෙල කළේ පරීක්ෂා කළේ බලය ලත් නිලධාරියාගේ අත්සන

CASH MEMO

අනුක්‍රමික අංකය :- 4856

දමිදු එන්ටර්ප්‍රයිසස්
245 සහන මාවත, මහරගම.
දුරකථන අංකය :- 0112266782
දිනය.......................

| නම |
|---|

| අයිතම් අංකය | විස්තරය | ඒකක ගණන | ඒකක මිල රු. | මුළු වටිනාකම රු. |
|---|---|---|---|---|
| | | | | |
| | එකතුව | | | |

පිළියෙල කළේ.......................
පරීක්ෂා කළේ.........................

...........................................
බලයලත් නිලධාරියාගේ
අත්සන



### ක්‍රියාකාරකම 01

ඔබ හෝ ඔබ පවුලේ සමාජිකයන් භාණ්ඩ මිලට ගෙන මුදල් ගෙවීමේ දී විවිධ ව්‍යාපාර විසින් නිකුත් කෙරෙන ලදුපත් විවිධ ආකාරයෙන් පවතී.

01. එවැනි ලදුපත් එක්රැස් කරන්න.
02. ලදුපතක අන්තර්ගත ව ඇති කරුණු ඒවායේ පවතී ද යන්න පරීක්ෂා කර බලන්න.

## ගෙවීම් වවුචරය

**ව්‍යාපාර විසින් සෑම මුදල් ගෙවීමක දී ම ඊට අදාළ තොරතුරු ඇතුළත් කර, වගකිව යුතු පුද්ගලයෙකු විසින් අත්සන් කර, ගෙවීම සනාථ කිරීම සඳහා පිළියෙල කෙරෙන ලියවිල්ල ගෙවීම් වවුචරය වේ.**

සෑම ගෙවීම් වවුචරයකට ම අනුක්‍රමික අංක යොදනු ලැබේ. මුදල් ගෙවීමේදී වගකිවයුතු පුද්ගලයෙකු අත්සන් කර ඇති බැවින් මෙය මුදල් ගෙවූ බවට ලිඛිත සාක්ෂියක් ලෙස භාවිත කළ හැකි වේ.

ගෙවීම් වවුචරය සඳහා ද පොදුවේ පිළිගත් නිශ්චිත ආකෘති නොමැති අතර සාමාන්‍යයෙන් පහත සඳහන් ආකාරයට එය සකස් කළ හැකි ය.

සී/ස ප්‍රියානි සමාගම

මහරගම

අනුක්‍රමික අංකය :- ................ දිනය ..................

.................................................................................................. ට ගෙවීම

| විස්තරය | ගෙවූ මුදල |
|---|---|
| | |

චෙක්පත් අංකය :- ..........................

| ........................................ | ........................................ | .............................................. |
|---|---|---|
| පිළියෙල කළ අයගේ අත්සන | ගෙවීම් අනුමත කළ අයගේ අත්සන | ගෙවීම් සහතික කළ අයගේ අත්සන |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## මුදල් පොතේ ද්විත්ව කාර්යය

මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ලදුපත් හා වවුචර යොදගනිමින් අනුපිළිවෙළින් ප්‍රථම වරට මුදල් පොතේ වාර්තා කිරීම සිදුකරන නිසා මුදල් පොත මූලික සටහන් පොතක කාර්යභාරය ඉටුකරයි. එසේම මුදල් පොතේ හර සහ බැර වශයෙන් දෙපැත්තක් ඇත. එම නිසා එය ගිණුමක කාර්යයද ඉටු කරයි.

එබැවින් මුදල් පොත තුළින් කාර්ය දෙකක් ඉටුවේ.

- මූලික සටහන් පොතක කාර්ය
- ලෙජර ගිණුමක කාර්ය

## මුදල් ගනුදෙනු සටහන් කිරීම

මුදල් යනු ව්‍යාපාරයක වත්කමකි. මුදල් ලැබීම් නිසා වත්කම් වැඩිවන අතර මුදල් ගෙවීම් නිසා වත්කම් අඩු වේ. මේ නිසා මුදල් පොතෙහි ගනුදෙනු සටහන් කරන විට වත්කම් ගිණුම්වලට අදාළ ද්විත්ව සටහන් රීතිය යොදා ගත යුතු ය.

මුදල් ලැබීම් මුදල් පොතට හර කෙරේ (වත්කම් වැඩිවීම හර යන රීතිය)
මුදල් ගෙවීම් මුදල් පොතට බැර කෙරේ (වත්කම් අඩුවීම බැර යන රීතිය)

ඒ අනුව මුදල් ලැබීම් මුදල් පොතට හර කර මුදල් ගෙවීම් මුදල් පොතට බැර කළ යුතු ය.

මුදල් ලැබීම්, මුදල් පොතට හර කරන විට මුදල් පොත ගිණුමක් ලෙස ද ක්‍රියා කරන බැවින් ද්විත්ව සටහනේ හර සටහන මුදල් පොත තුළ දී ම අවසන් වේ. ලෙජරයේ ඒ වෙනුවෙන් තැබිය යුත්තේ අදාළ ගිණුමේ බැර සටහන පමණි. එසේ ම මුදල් ගෙවීම මුදල් පොතට බැර කරන විට ද්විත්ව සටහනේ බැර සටහන මුදල් පොත තුළ දී ම අවසන් වේ. ලෙජරයේ ඒ වෙනුවෙන් තැබිය යුත්තේ අදාළ ගිණුමේ හර සටහන පමණි. ඒ අනුව

- මුදල් පොතට හර කර ඇති වටිනාකම් ලෙජරයේ අදාළ අනෙක් ගිණුම්වලට බැර කළ යුතු වේ.
- මුදල්පොතට බැර කර ඇති වටිනාකම් ලෙජරයේ අදාළ අනෙක් ගිණුම්වලට හර කළ යුතු වේ.

**නිදසුන් ඃ-**

පහත දැක්වෙන්නේ 20XX.01.01 දින ලක්ෂිණී විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයේ ජනවාරි මාසයේ මුදල් ගනුදෙනුවලට අදාළ තොරතුරු ය.

| දිනය | ලදුපත් අංකය | වවුචර් අංකය | විස්තරය |
|---|---|---|---|
| 20XX.01.01 | 01 | | රු. 80 000ක් ප්‍රාග්ධනය යෙදීම |
| 01.02 | | 001 | රු. 45 000ක වෙළඳ භාණ්ඩ මිල දී ගැනීම |
| 01.04 | 02 | | රු. 50 000ක බැංකු ණය ගැනීම |
| 01.08 | | 002 | රු. 8 000ක ලී බඩු මිලදී ගැනීම |
| 01.15 | | 003 | රු. 6 000ක කඩකුලී ගෙවීම |
| 01.18 | 03 | | අත්පිට විකුණුම්වලින් රු. 40 000ක් ලැබීම |
| 01.20 | 04 | | ණය ගැතියකු වූ පවන්ගෙන් රු. 30 000ක් ලැබීම |
| 01.24 | | 004 | ණයහිමියකු වූ සුරත්ට රු. 34 000ක් ගෙවීම |
| 01.25 | | 005 | පෞද්ගලික ප්‍රයෝජනයට රු. 5 000ක මුදල් ගැනීම |
| 01.26 | 05 | | රු. 3 000ක පොලී ආදායම් ලැබීම |
| 01.28 | | 006 | රු. 6 000ක බැංකු ණය ආපසු ගෙවීම |

ඉහත නිදසුනෙහි සඳහන් ගනුදෙනු ලක්ෂිණීගේ ව්‍යාපාරයේ මුදල් පොතේ සහ අදාළ ලෙජර් ගිණුම්වල පහත දැක්වෙන ආකාරයට සටහන් කරනු ලැබේ.

හර මුදල් පොත බැර

| දිනය | ලදුපත් අංකය | විස්තරය | ස පි | වටිනාකම රු. | දිනය | වවුචර අංකය | විස්තරය | ස පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 20XX.01.01 | 01 | ප්‍රාග්ධනය | | 80 000 | 20XX.01.02 | 001 | ගැනුම් | | 45 000 |
| 01.04 | 02 | බැංකු ණය | | 50 000 | 01.08 | 002 | ලී බඩු | | 8 000 |
| 01.18 | 03 | විකුණුම් | | 40 000 | 01.15 | 003 | කඩකුලී | | 6 000 |
| 01.20 | 04 | ණයගැති - පවන් | | 30 000 | 01.24 | 004 | ණයහිමි - සුරත් | | 34 000 |
| 01.26 | 05 | පොලී ආදායම් | | 3 000 | 01.25 | 005 | ගැනිලි | | 5 000 |
| | | | | | 01.28 | 006 | බැංකු ණය | | 6 000 |

හර ප්‍රාග්ධන ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.01.01 | මුදල් | | 80 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර ගැනුම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20xx.01.02 | මුදල් | | 45 000 | | | | |

හර බැංකු ණය ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20xx.01.28 | මුදල් | | 6 000 | 20xx.01.04 | මුදල් | | 50 000 |

හර ලී බඩු ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20xx.01.08 | මුදල් | | 8 000 | | | | |

හර කඩකුලී වියදම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20xx.01.15 | මුදල් | | 6 000 | | | | |

හර විකුණුම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20xx.01.18 | මුදල් | | 40 000 |

හර පවන්ගේ ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20xx.01.20 | මුදල් | | 30 000 |

හර සුරත්ගේ ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.24 | මුදල් | | 34 000 | | | | |

හර ගැනිලි ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.25 | මුදල් | | 5 000 | | | | |

හර පොලී ආදයම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.01.26 | මුදල් | | 3 000 |

## ගිණුම් තුලනය කිරීම

ගනුදෙනුවක වටිනාකම් ගිණුම්වල සටහන් කිරීමේදී ද්විත්ව සටහන් රීතිවලට අනුව හර හෝ බැර කරනු ලැබේ. යම් කාලච්ඡේදයක් අවසානයේ දී ගිණුමක හර හා බැර සටහන්හි මුළු වටිනාකම්වල වෙනස ගණනය කරගත යුතු ය. එම වෙනස ගිණුමේ ශේෂය ලෙසට හඳුනා ගැනේ. ගිණුම් තුලනය කිරීම අවශ්‍ය වන්නේ ගිණුමක ශේෂය හඳුනා ගැනීම සඳහා ය.

**නිදසුන් :-**

කාලච්ඡේදයක් තුළ මුදල් ලැබීම්වල එකතුව රු. 50 000කි. ගෙවීම්වල එකතුව රු. 33 000කි. එවිට ඉතිරි මුදල වන්නේ රු. 17 000කි. මුදල් පොතේ ශේෂය ලෙස සලකන්නේ එම අගය යි.

තෝරාගත් ගිණුම් කිහිපයක් තුලනය කොට ඇති ආකාරය පරීක්ෂා කර බලන්න.

හර ප්‍රාග්ධන ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.31 | ශේෂය ප/ගෙ * | | 80 000 | 20XX.01.01 | මුදල් | | 80 000 |
| | | | 80 000 | | | | 80 000 |
| | | | | 20XX.02.01 | ශේෂය ඉ/ගෙ * | | 80 000 |

* ශේෂය පහළට ගෙන යාම

* ශේෂය ඉදිරියට ගෙන ඒම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර කඩකුලී වියදම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.15 | මුදල් | | 6 000 | 20XX.01.31 | ශේෂය ප/ගෙ | | 6 000 |
| | | | 6 000 | | | | 6 000 |
| 20XX.02.01 | ශේෂය ඉ/ගෙ | | 6 000 | | | | |

හර මුදල් පොත බැර

| දිනය | ලදුපත් අංකය | විස්තරය | ස පි | වටිනාකම රු. | දිනය | වවුචර අංකය | විස්තරය | ස පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 20XX.01.01 | 01 | ප්‍රාග්ධනය | | 80 000 | 20XX.01.02 | 001 | ගැනුම් | | 45 000 |
| 01.04 | 02 | බැංකු ණය | | 50 000 | 01.08 | 002 | ලී බඩු | | 8 000 |
| 01.18 | 03 | විකුණුම් | | 40 000 | 01.15 | 003 | කඩකුලී | | 6 000 |
| 01.20 | 04 | ණයගැති - පවන් | | 30 000 | 01.24 | 004 | ණයහිමි - සුරත් | | 34 000 |
| 01.26 | 05 | පොලී ආදායම් | | 3 000 | 01.25 | 005 | ගැනිලි | | 5 000 |
| | | | | | 01.28 | 006 | බැංකු ණය | | 6 000 |
| | | | | | | | ශේෂය ප/ගෙ | | 99 000 |
| | | | | 203 000 | | | | | 203 000 |
| 20XX.02.01 | | ශේෂය ඉ/ගෙ | | 99 000 | | | | | |

ඒ අනුව



- ගිණුමක හර පැත්ත බැර පැත්තට වඩා වැඩි වේ නම් ලැබෙන ශේෂය හර ශේෂයක් වන බවත්
- ගිණුමක හර පැත්තට වඩා බැර පැත්ත වැඩි නම් ලැබෙන ශේෂය බැර ශේෂයක් වන බවත් ඔබට පැහැදිලි වනු ඇත.



## ක්‍රියාකාරකම 02

20XX.05.01 දින පූර්ණිමා විසින් ආරම්භ කළ වෙළඳ ව්‍යාපාරයේ 20XX.05.31 දිනෙන් අවසන් වූ මාසයට අදළ මුදල් ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | ලදුපත් අ. | වවුචර් අ. | විස්තරය |
|---|---|---|---|
| 20XX.05.01 | 001 | | රු. 60 000ක් යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම |
| 05.02 | | 01 | රු. 35 000ක වෙළඳ භාණ්ඩ තොගයක් මිල දී ගැනීම |
| 05.04 | 002 | | බැංකුවෙන් රු. 40 000ක ණය මුදලක් ගැනීම |
| 05.08 | 003 | | අත්පිට විකුණුම්වලින් රු. 13 000ක මුදලක් ලැබීම |
| 05.12 | | 02 | සේවක වැටුප් රු. 5 000ක් ගෙවීම |
| 05.15 | | 03 | ව්‍යාපාර භාවිතයට රු. 12 000ක උපකරණ මිලට ගැනීම |
| 05.20 | 004 | | කුලී ආදායම් රු 6 000ක් ලැබීම |
| 05.22 | 005 | | අත්පිට විකුණුම් රු. 18 000කි |
| 05.25 | | 04 | බැංකු ණය කොටසක් පියවීම සඳහා රු. 5 000ක් ගෙවීම |
| 05.30 | 006 | | කොමිස් ආදායම් රු. 14 000ක් ලැබීම |

**අවශ්‍ය වන්නේ :-**


අදළ ලෙජර් ගිණුම්වල ගනුදෙනු සටහන් කර එම ගිණුම් තුලය කිරීම.



නොමිලේ බෙද හැරීම සඳහා ය.

## වට්ටම්

යම් ගනුදෙනුවක් සිදුවීමේ දී එම ගනුදෙනුවේ වටිනාකමින් අඩු කරනු ලබන අගය වට්ටම් ලෙස කෙටියෙන් හැඳින්විය හැකි ය. වට්ටම්, වෙළඳ වට්ටම් හා මුදල් වට්ටම් වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකි ය. එම දෙවර්ගයෙහි ම දුන් වට්ටම් මෙන් ම ලද වට්ටම් තිබිය හැකි ය.




රූපය 8.1 වට්ටම්

## වෙළඳ වට්ටම්

බොහෝ ව්‍යාපාර විසින් භාණ්ඩයක ලකුණු කළ මිලෙන් කිසියම් වටිනාකමක් අඩු කර විකුණනු ලැබේ. මෙසේ ලකුණු කළ මිලෙන් කරන අඩු කිරීම වෙළඳ වට්ටමක් ලෙස හැඳින්වේ. මෙම අඩු කිරීම විකුණුම්කරුගේ පාර්ශ්වයෙන් දුන් වෙළඳ වට්ටමක් වන අතර ගැනුම්කරුගේ පාර්ශ්වයෙන් ලද වෙළඳ වට්ටමකි.

ව්‍යාපාරය විසින් පිළියෙල කරන ගැනුම් ගිණුමේ හෝ විකුණුම් ගිණුමේ සටහන් කළ යුත්තේ වෙළඳ වට්ටම් අඩු කළ පසු ලැබෙන ශුද්ධ වටිනාකම වේ. මේ නිසා වෙළඳ වට්ටම්, ගිණුම්වල සටහන් කරනු නොලැබේ.

**නිදසුන් :-**

| | | |
|---|---|---|
| මිල දී ගන්නා භාණ්ඩයක ලකුණු කළ මිල | | = රු. 20 000 |
| අඩු කෙරෙන වෙළඳ වට්ටම | | 10% |
| ඒ අනුව, | | |
| වෙළඳ වට්ටමේ ප්‍රමාණය | $20\ 000 \times \frac{10}{100}$ | = රු. 2 000 |
| වෙළඳ වට්ටම් අඩු කළ පසු ගෙවූ ශුද්ධ වටිනාකම | | = රු. 18 000 |

ගිණුම් ගත කරන්නේ මෙම රු. 18 000 පමණි.

හර ගැනුම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | මුදල් | | 18 000 | | | | |

හර මුදල් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ගැනුම් | | 18 000 |

## මුදල් වට්ටම්

ණයට භාණ්ඩ විකිණීමේ දී ණයගැතියෝ බිහි වෙති. එහි දී ලැබිය යුතු ණය මුදල ණයගැති ගිණුමක සටහන් කළ යුතු ය. එමෙන් ම ණයට භාණ්ඩ ගැනීමේ දී ණයහිමියෝ බිහි වෙති. එහි දී ගෙවිය යුතු ණය මුදල ණයහිමි ගිණුමක සටහන් කළ යුතු ය. මුදල් වට්ටම් ඇති වන්නේ මෙම ණය බේරුම් කරන විට දී ය.

වෙළඳ ගනුදෙනු ණයට සිදුකරන විට ඉක්මනින් ණය බේරුම් කිරීමට ගැනුම්කරු පෙළඹවීම සඳහා යම් නිශ්චිත කාලයක් තුළ ණය බේරුම් කළහොත් ණය මුදලෙන් කිසියම් ප්‍රතිශතයක් අඩු කරන බවට කොන්දේසියක් විකුණුම්කරු විසින් ඉන්වොයිසියෙහි ඇතුළත් කරන අවස්ථා ඇත. එසේ නියමිත කාලය තුළ ණය බේරුම් කරන විට ණය මුදලෙන් කරනු ලබන අඩු කිරීම මුදල් වට්ටම් ලෙස හැඳින්වේ.

මුදල් වට්ටම් වර්ග දෙකකි.

- දුන් වට්ටම
- ලද වට්ටම

## දුන් වට්ටම්

**ඉඩ දුන් කාලය තුළ ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේ දී ලැබිය යුතු ණය වටිනාකමින් කෙරෙන අඩු කිරීම** දුන් මුදල් වට්ටමකි. ව්‍යාපාරය පැත්තෙන් බැලූ විට දුන් වට්ටම් වියදමක් ලෙස සලකනු ලැබේ.

ඒ අනුව දුන් වට්ටම් ඇති වන්නේ ණය ගැතියන්ගෙන් මුදල් ලැබීමේ දී නිසා ණය ගැති ලැබීම් මුදල් පොතේ සටහන් කරනවිට ම දුන් වට්ටම ද මුදල් පොතේ සටහන් කිරීම පහසු වේ. ඒ සඳහා මුදල් පොතේ හර පැත්තේ වෙන ම තීරුවක් විවෘත කර දුන් වට්ටම් එහි සටහන් කරනු ලැබේ.

## ලද වට්ටම්

**ඉඩ දුන් කාලය තුළ ණයහිමියන්ට මුදල් ගෙවීමේ දී ගෙවිය යුතු ණය වටිනාකමින් ණය හිමියන් කරන අඩු කිරීම** ලද මුදල් වට්ටම වේ. මෙය ව්‍යාපාරයේ ආදයමක් ලෙස සලකනු ලැබේ.

ලද වට්ටම ඇති වන්නේ ණය හිමියන්ට ගෙවීම් කිරීමේ දීය. ණය හිමි ගෙවීම් මුදල් පොතට බැර කරන ගමන් ම ලද වට්ටම් ද මුදල් පොතේ සටහන් කිරීම පහසු වේ. ඒ සඳහා මුදල් පොතේ බැර පැත්තේ වෙන ම තීරුවක් විවෘත කර එහි ලද වට්ටම් සටහන් කරනු ලැබේ.

මෙම වට්ටම් තීරු **සිහිවටන තීරු** ලෙස සලකනු ලැබේ. ඒවායින් ඉටු වන්නේ උපයෝගී පොතක කාර්ය පමණි. වට්ටම් තීරු, ගිණුමක කාර්යභාරය ඉටු නොකරන නිසා එම තීරුවල යම් අගයක් සටහන් කළ පමණින් ගනුදෙනු සඳහා තැබිය යුතු ද්විත්ව සටහනෙන් එක් සටහනක්වත් සම්පූර්ණ නොවේ. මේ නිසා වට්ටම් තීරුවල සටහන් කරන ගනුදෙනු සඳහා ලෙජරයේ වෙන ම ද්විත්ව සටහන් තැබිය යුතු ය.

## මුදල් වට්ටම් ගිණුම්වල සටහන් කිරීම

මුදල් පොතේ හර පැත්තේ ඇති දුන් වට්ටම් තීරුවේ එකතුව ලෙජරයේ විවෘත කරන දුන් වට්ටම් ගිණුමට හර කරනු ලැබේ. දුන් වට්ටම් වියදම් ගිණුම් වර්ගයට අයත් වන බැවින් වියදම් වැඩි වීම හර යන රීතිය ඊට අදාළ වේ. බැර සටහන් ඒ ඒ ණයගැති ගිණුම්වල තැබිය යුතුය. එසේ කරනුයේ වත්කම් අඩුවීම බැර යන ද්විත්ව සටහන් රීතියට අනුකූල ව ය.

ඒ අනුව දුන් වට්ටම්වලට අදාළ ද්විත්ව සටහන පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| දුන් වට්ටම් ගිණුම | හර |
| ණයගැති ගිණුම් | බැර |

මුදල් පොතේ බැර පැත්තේ ඇති ලද වට්ටම් තීරුවේ එකතුව ලෙජරයේ විවෘත කරනු ලබන ලද වට්ටම් ගිණුමට බැර කරනු ලැබේ. ලද වට්ටම් ආදයම් ගිණුම් වර්ගයට අයත් නිසා ආදයම් වැඩි වීම බැර යන රීතිය ඊට අදාළ වේ. හර සටහන් ඒ ඒ ණයහිමි ගිණුම්වල තැබිය යුතු ය. එසේ කරනුයේ වගකීම් අඩු වීම හර යන ද්විත්ව සටහන් රීතියට අනුකූල වන බැවිනි.

ඒ අනුව ලද වට්ටම්වලට අදාළ ද්විත්ව සටහන පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ණයහිමි ගිණුම් | හර |
| ලද වට්ටම් ගිණුම | බැර |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නිදසුන් ඃ-

සාරංගගේ ව්‍යාපාරයේ 20XX.03.01 දිනට පහත දැක්වෙන ශේෂයන් පැවතුණි.

| | | රු. |
|---|---|---|
| ණය ගැති ශේෂ | | |
| | බුද්ධි | 40000 |
| | සනෝද් | 30000 |
| ණය හිමි ශේෂ | | |
| | මනීෂා | 45000 |
| | සිතුමිණි | 35000 |
| මුදල් ශේෂය | | 50000 |

මාර්තු මාසයේ පහත දැක්වෙන ගනුදෙනු සිදුවිය.

03.05 බුද්ධිගෙන් ලැබූ මුදල රු. 12 500යි. අඩු කළ වට්ටම රු. 2 500කි.
03.08 සනෝද්ගෙන් රු. 10 000 ක ණය ලැබීමේදී අඩු කළ වට්ටම 5%කි.
03.10 මනීෂාට ගෙවූ මුදල රු. 12 600 යි. අඩු කළ වට්ටම රු. 1 400කි.
03.15 සිතුමිණි ට රු. 20 000 ක ණය ගෙවීමේදී අඩු කළ වට්ටම 5%කි.

ඉහත දැක්වෙන ගනුදෙනු මුදල් පොතේ සහ අදාළ ලෙජර ගිණුම්වල සටහන් කොට තුලනය කරන ආකාරය පහත දැක්වේ.

හර මුදල් පොත බැර

| දිනය | විස්තරය | ස. පි | වට්ටම් | මුදල් | දිනය | විස්තරය | ස. පි | වට්ටම් | මුදල් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | | 50 000 | | | | | |
| 03.05 | බුද්ධි | | 2 500 | 12 500 | 20XX.03.10 | මනීෂා | | 1 400 | 12 600 |
| 03.08 | සනෝද් | | 500 | 9 500 | 03.15 | සිතුමිණි | | 1 000 | 19 000 |
| | | | | | 03.31 | ශේෂය ප/ගෙ | | | 40 400 |
| | | | 3 000 | 72 000 | | | | 2 400 | 72 000 |
| 04.01 | ශේෂය ඉ/ගෙ | | | 40 400 | | | | | |

හර බුද්ධි (ණයගැති) ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 40 000 | 20XX.03.05 | මුදල් | | 12 500 |
| | | | | 03.05 | දුන් වට්ටම් | | 2 500 |
| | | | | 03.31 | ශේෂය ප/ගෙ | | 25 000 |
| | | | 40 000 | | | | 40 000 |
| 04.01 | ශේෂය ඉ/ගෙ | | 25 000 | | | | |

හර සනෝද් (ණයගැති) ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 30 000 | 20XX.03.08 | මුදල් | | 9 500 |
| | | | | 03.08 | දුන් වට්ටම් | | 500 |
| | | | | 03.31 | ශේෂය ප/ගෙ | | 20 000 |
| | | | 30 000 | | | | 30 000 |
| 04.01 | ශේෂය ඉ/ගෙ | | 20 000 | | | | |

හර මනිෂා (ණයහිමි) ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.10 | මුදල් | | 12 600 | 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 45 000 |
| 03.10 | ලද වට්ටම් | | 1 400 | | | | |
| 03.31 | ශේෂය ප/ගෙ | | 31 000 | | | | |
| | | | 45 000 | | | | 45 000 |
| | | | | 04.01 | ශේෂය ඉ/ගෙ | | 31 000 |

හර සිතුමිණි (ණයහිමි) ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.15 | මුදල් | | 19 000 | 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 35 000 |
| 03.15 | ලද වට්ටම් | | 1 000 | | | | |
| 03.31 | ශේෂය ප/ගෙ | | 15 000 | | | | |
| | | | 35 000 | | | | 35 000 |
| | | | | 04.01 | ශේෂය ඉ/ගෙ | | 15 000 |

හර දුන් වට්ටම් ගිණුම හර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | ණයගැති | | 3 000 | 20XX.03.31 | ශේෂය ප/ගෙ | | 3 000 |
| | | | 3 000 | | | | 3 000 |
| 04.01 | ශේෂය ඉ/ගෙ | | 3 000 | | | | |

හර ලද වට්ටම් ගිණුම හර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | ශේෂය ප/ගෙ | | 2 400 | 20XX.03.31 | ණයහිමි | | 2 400 |
| | | | 2 400 | | | | 2 400 |
| | | | | | ශේෂය ඉ/ගෙ | | 2 400 |

**නිදසුන් :-**

සපුමලීගේ ව්‍යාපාරයේ 20XX.03.01 දිනට පහත දැක්වෙන ශේෂයන් පැවතුණි.

| | |
|---|---|
| ණයගැති ශේෂය (හර) | රු. 40 000 |
| ණයහිමි ශේෂය (බැර) | රු. 50 000 |
| මුදල් ශේෂය (හර) | රු. 30 000 |

20XX.03.05 ණයගැතියන්ගෙන් ලැබූ මුදල රු. 7 600. අඩු කළ වට්ටම රු. 400කි.

20XX.03.08 ණයගැතියන්ගෙන් රු 10 000ක ණය ලැබීමේ දී අඩු කළ වට්ටම 5 %කි.

20XX.03.10 ණයහිමියන්ට ගෙවූ මුදල රු 4 700ක් වූ අතර ලද වට්ටම රු 300කි.

20XX.03.15 ණයහිමියන්ට රු 12 000 ක ණය ගෙවීමේදී අඩු කළ වට්ටම 10%කි.

ඉහත ගනුදෙනු මුදල් පොතේ සහ අදාළ ලෙජර් ගිණුම්වල සටහන් කොට තුලනය කරන ආකාරය පහත දැක්වේ.

හර — මුදල් ගිණුම — බැර

| දිනය | විස්තරය | වට්ටම් | මුදල් | දිනය | විස්තරය | වට්ටම් | මුදල් |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 30 000 | 20XX.03.10 | ණයහිමි | 300 | 4 700 |
| 03.05 | ණයගැති | 400 | 7 600 | 03.15 | ණයහිමි | 1 200 | 10 800 |
| 03.08 | ණයගැති | 500 | 9 500 | | | | |
| | | | | 03.31 | ශේෂය ප/ගෙ | | 31 600 |
| | | 900 | 47 100 | | | 1 500 | 47 100 |
| 04.01 | ශේෂය ඉ/ගෙ | | 31 600 | | | | |

හර — ණය ගැති ගිණුම — බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 40 000 | 20XX.03.05 | මුදල් | | 7 600 |
| | | | | 03.05 | දුන් වට්ටම් | | 400 |
| | | | | 03.08 | මුදල් | | 9 500 |
| | | | | 03.08 | දුන් වට්ටම් | | 500 |
| | | | | 03.31 | ශේෂය ප/ගෙ | | 22 000 |
| | | | 40 000 | | | | 40 000 |
| 04.01 | ශේෂය ඉ/ගෙ | | 22 000 | | | | |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර ණයහිමි ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.10 | මුදල් | | 4 700 | 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 50 000 |
| 03.10 | ලැබූ වට්ටම් | | 300 | | | | |
| 03.15 | මුදල් | | 10 800 | | | | |
| 03.15 | ලැබූ වට්ටම් | | 1 200 | | | | |
| | | | 33 000 | | | | |
| 03.31 | ශේෂය ඉ/ගෙ | | 50 000 | | | | 50 000 |
| | | | | 04.01 | ශේෂය ඉ/ගෙ | | 33 000 |

හර දුන් වට්ටම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | ණයගැති | | 900 | 20XX.03.31 | ශේෂය ප/ගෙ | | 900 |
| | | | 900 | | | | 900 |
| 04.01 | ශේෂය ඉ/ගෙ | | 900 | | | | |

හර ලද වට්ටම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | ශේෂය ප/ගෙ | | 1 500 | 20XX.03.31 | ණය හිමි | | 1 500 |
| | | | 1 500 | | | | 1 500 |
| | | | | 04.01 | ශේෂය ඉ/ගෙ | | 1 500 |

ණයගැතියන්ගෙන් මුදල් මෙන් ම චෙක්පත් ද ලැබේ. එසේ ම අත්පිට විකුණුම් සිදුකරන විට දී ද චෙක්පත් ලැබිය හැකි ය. එලෙස ලැබුණු චෙක්පත් එදින ම බැංකුවේ තැන්පත් නොකරන්නේ නම් ඒවා ද මුදල් නෝට්ටු මෙන් ගනුදෙනු සඳහා යොදා ගත හැකි ය. ඒ නිසා එවැනි චෙක්පත් ලැබීම් ද මුදල් ලැබීම් සටහන් කළ ආකාරයට ම මුදල් පොතේ සටහන් කරනු ලැබේ. ණයගැතියන්ගෙන් චෙක්පත් ලැබීමේ දී ද දුන් වට්ටම් ඇති විය හැකි ය. එම වට්ටම් ද මුදල් පොතේ හර පැත්තේ ඇති දුන් වට්ටම් තීරුවේ සටහන් කළ යුතු වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**නිදසුන් ඃ-**

හිරුකිගේ ව්‍යාපාරයේ 20XX.03.01 දිනට පහත ශේෂයන් පවතී.

| | | රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 100 000 |
| ණයහිමියන් | සුරංග | 25 000 |
| | තරංග | 15 000 |
| මුදල් | | 80 000 |
| ණයගැතියන් | මල්කා | 40 000 |
| | ඉමල්කා | 20 000 |

මාර්තු මාසය තුළ සිදු වු මුදල් ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | ලදුපත් අංකය | ව. අ. | විස්තරය |
|---|---|---|---|
| 20XX.03.02 | 65 | | මල්කා ගෙන් රු. 8 000ක් ලැබිණි. |
| 03.05 | | 40 | අත්පිට ගැනුම් රු. 35 000කි. |
| 03.08 | | 41 | සුරංගට රු. 6 000ක් ගෙවී ය. |
| 03.10 | 66 | | ඉමල්කාගෙන් රු. 12 000ක ණය වෙනුවෙන් මුදල් ලැබීමේ දී 5% ක වට්ටමක් දෙන ලදි. |
| 03.12 | | 42 | තරංගට රු. 10 000ක ණය ගෙවීමේදී 8%ක වට්ටමක් ලැබිණි. |
| 03.15 | 67 | | විකුණුම්වලින් රු. 16 000ක චෙක්පතක් ලැබී ඇත. |
| 03.18 | 68 | | මල්කාගෙන් ලැබුණු මුදල රු. 6 650ක් වු අතර අඩු කළ වට්ටම රු. 350කි. |
| 03.20 | | 43 | සුරංගට රු. 8 000ක ණය ගෙවීමේදී අඩු කළ වට්ටම රු. 400කි. |
| 03.24 | 69 | | විකුණුම්වලින් රු. 6 000ක මුදල් ද රු. 7 000ක චෙක්පත් ද ලැබී ඇත. |
| 03.29 | 70 | | අමතර ප්‍රාග්ධනය ලෙස හිරුකි රු. 20 000ක් ව්‍යාපාරයේ යෙදවී ය. |

ඉහත නිදසුනෙහි දැක්වෙන ගනුදෙනු වට්ටම් තීරුව සහිත මුදල් පොතේ හා ලෙජර් ගිණුම්වල සටහන් වන අන්දම පහත දැක්වේ.

| හර | | | | මුදල් පොත | | | | | බැර |
|---|---|---|---|---|---|---|---|---|---|
| දිනය | ල. අ. | විස්තරය | වට්ටම් | මුදල් | දිනය | ව. අ. | විස්තරය | වට්ටම් | මුදල් |
| 20XX.03.01 | | ශේෂය ඉ/ගෙ | | 80 000 | 20XX.03.05 | 40 | ගැනුම් | | 35 000 |
| 03.02 | 65 | මල්කා | | 8 000 | 03.08 | 41 | සුරංග | | 6 000 |
| 03.10 | 66 | ඉමල්කා | 600 | 11 400 | 03.12 | 42 | තරංග | 800 | 9 200 |
| 03.15 | 67 | විකුණුම් (චෙක්) | | 16 000 | 03.20 | 43 | සුරංග | 400 | 7 600 |
| 03.18 | 68 | මල්කා | 350 | 6 650 | 03.31 | | ශේෂය ප/ගෙ | | 97 250 |
| 03.24 | 69 | විකුණුම් | | 6 000 | | | | | |
| | | විකුණුම් (චෙක්) | | 7 000 | | | | | |
| 03.29 | 70 | ප්‍රාග්ධනය | | 20 000 | | | | | |
| | | | 950 | 155 050 | | | | 1200 | 155 050 |
| 04.01 | | ශේෂය ඉ/ගෙ | | 97 250 | | | | | |

| හර | | | ප්‍රාග්ධන ගිණුම | | | | බැර |
|---|---|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
| | | | | 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 100 000 |
| | | | | 03.29 | මුදල් | | 20 000 |

| හර | | | දුන් වට්ටම් ගිණුම | | | | බැර |
|---|---|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
| 20XX.03.31 | ණයගැති | | 950 | | | | |

| හර | | | මල්කා (ණයගැති) ගිණුම | | | | බැර |
|---|---|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
| 20XX.03.01 | ඉ/ගෙ ශේෂය | | 40 000 | 20XX.03.02 | මුදල් | | 8 000 |
| | | | | 03.18 | මුදල් | | 6 650 |
| | | | | 03.18 | දුන් වට්ටම් | | 350 |

| හර | | | ඉමල්කා (ණයගැති) ගිණුම | | | | බැර |
|---|---|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
| 20XX.03.01 | ඉ/ගෙ ශේෂය | | 20 000 | 20XX.03.10 | මුදල් | | 11 400 |
| | | | | 03.10 | දුන් වට්ටම් | | 600 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර ලද වට්ටම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.03.31 | ණයහිමි | | 1 200 |

හර ගැනුම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.05 | මුදල් | | 35 000 | | | | |

හර සුරංග (ණයහිමි) ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.08 | මුදල් | | 6 000 | 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 25 000 |
| 03.20 | මුදල් | | 7 600 | | | | |
| 03.20 | ලැබූ වට්ටම් | | 400 | | | | |

හර තරංග (ණයහිමි) ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.12 | මුදල් | | 9 200 | 20XX.03.01 | ශේෂය ඉ/ගෙ | | 15 000 |
| 03.12 | ලැබූ වට්ටම් | | 800 | | | | |

හර විකුණුම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.03.15 | මුදල් | | 16 000 |
| | | | | 03.24 | මුදල් | | 13 000 |



## ක්‍රියාකාරකම 03

අනුරාධාගේ ව්‍යාපාරයේ 20XX.07.01 දිනට පැවැති ශේෂයන් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| මුදල් | | 70 000 |
| ණයගැති | හසල | 22 000 |
| | රවීශ | 28 000 |
| ප්‍රාග්ධනය | | 75 000 |
| ණයහිමි | සහස්‍රා | 25 000 |
| | කෞමදී | 20 000 |

ජුලි මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| 20XX.07.03 | අත්පිට ගැනුම් රු. 28 000කි. |
| 07.08 | හසලගෙන් මුදල් ලැබුණා රු. 7 000යි. |
| 07.12 | අත්පිට විකුණුම් රු. 12 000කි. |
| 07.16 | කෞමදීට රු. 8 000ක ණය පියවීමේදී 10%ක වට්ටමක් ලැබී ඇත. |
| 07.18 | රවීශගෙන් රු. 10 000ක ණය සඳහා 5%ක වට්ටමක් දෙන ලදි. |
| 07.20 | කඩකුලී ගෙවීම් රු. 4 000කි. |
| 07.25 | කෞමදීට රු. 8 000ක ණය පියවීමේදී අඩු කළ වට්ටම රු. 500කි. |
| 07.26 | රවීශ රු. 800ක වට්ටමක් අඩුකර ගෙන රු. 7 200ක චෙක්පතක් එවා තිබිණ. |
| 07.28 | කෞමදීට රු. 2 000ක ණය ගෙවීමේදී 5% ක වට්ටමක් ලැබිණ. |

අවශ්‍ය වන්නේ,

01. වට්ටම් තීරුව සහිත මුදල් පොත පිළියෙල කර 20XX.07.31 දිනට තුලනය කිරීම
02. මුදල් පොතේ සටහන් කළ ගනුදෙනු අනෙකුත් ලෙජර ගිණුම්වලට පිටපත් කිරීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 8.2 සුළු මුදල් පොත

ව්‍යාපාරයක සිදුවන ගෙවීම්වලින් සමහර ගෙවීම් අඩු වටිනාකම්වලින් යුක්ත නිතර කරන ගෙවීම් ය.

**නිදසුන් ඃ-**

පිරිසිදු කිරීමේ වියදම් රු. 150ක් ගෙවීම
තැපැල් ගාස්තු රු. 60ක් ගෙවීම
ගමන් වියදම් රු. 70ක් ගෙවීම

මේ අනුව තැපැල් ගාස්තු, පිරිසිදු කිරීමේ වියදම්, ගමන් වියදම්, සංග්‍රහ කිරීමේ වියදම්, ලිපිද්‍රව්‍ය වියදම් ආදී දේ එදිනෙදා ගෙවන අඩු වටිනාකම්වලින් යුක්ත සුළු ගෙවීම් සඳහා නිදසුන් වේ.

ව්‍යාපාරයක නිතර නිතර සිදුවන සුළු වටිනාකම් සහිත මුදල් ගෙවීම් පිළිබඳ ගනුදෙනු සටහන් කරනු ලබන මූලික පොත සුළු මුදල් පොත නම් වේ.

එහි වගකීම ප්‍රධාන මුදල් භාරකරු යටතේ පත්කරන සුළු මුදල් භාරකරුවෙකු වෙත පවරනු ලබයි. සෑම සුළු මුදල් ගෙවීමක් සඳහා ම වවුචරයක් පිළියෙල කළ යුතු ය. එය සුළු මුදල් ගෙවීම් වවුචරය ලෙස හඳුන්වයි. මෙය සුළු මුදල් පොතේ ගෙවීම් සටහන් කිරීම සඳහා මූලාශ්‍ර ලේඛනය ලෙස යොදා ගනී.

### සුළු මුදල් අග්‍රිමය

පාලනයකින් යුතු ව සුළු මුදල් ගෙවීම් පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන මුදල් භාරකරු යටතේ පත්කරන සුළු මුදල් භාරකරුට යම් නිශ්චිත මුදලක් ලබා දෙන අතර එම මුදල සුළු මුදල් අග්‍රිමය නම් වේ. එම සුළු මුදල් අග්‍රිමය භාවිතයෙන් සුළු ගෙවීම් සිදු කිරීම සහ සුළු මුදල් පොත පවත්වා ගැනීම සුළු මුදල් භාරකරුගේ වගකීම වේ.

### සුළු මුදල් වියදම් ප්‍රතිපූරණය කිරීම

අග්‍රිමය අවසාන වීමට ආසන්න වූ විට සුළු මුදල් භාරකරු ප්‍රධාන මුදල් භාරකරුගෙන් නැවත මුදල් ඉල්ලා සිටිය යුතු ය. එවිට ඒ දක්වා ගෙවා ඇති මුදලට සමාන මුදලක් නැවතත් සුළු මුදල් භාරකරුට ලබා දී අග්‍රිමය සම්පූර්ණ කරයි. එසේ කිරීම සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම ලෙස හැඳින්වේ.

**නිදසුන් ඃ-**

ලිහිණිගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 2 000කි. ලැබුණු සුළු මුදල් අග්‍රිමයෙන් සිදුකළ සුළු මුදල් ගෙවීම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ලිපිද්‍රව්‍ය සඳහා | 250 |
| පිරිසිදු කිරීමේ වියදම් | 600 |
| සංග්‍රහ ගාස්තු | 400 |
| ගමන් වියදම් | 350 |
| | 1 600 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මේ අනුව වියදම් කළ මුදල රු. 1 600කි. සුළු මුදල් භාරකරු නැවත මුදල් ඉල්ලා සිටින විට ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ලබා දෙන්නේ වියදම් කළ මුදල වූ රු. 1 600ක් පමණි. එය සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීමකි.

| එවිට, | රු. |
|---|---|
| අත ඉතිරි සුළුමුදල් ශේෂය | 400 |
| සුළු වියදම් ප්‍රතිපූරණය | 1 600 |
| සුළු මුදල් අග්‍රිමය | 2 000 |

සුළු මුදල් ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා සුළු මුදල් භාරකරු විසින් ඒ දක්වා සිදු කරන ලද සුළු මුදල් ගෙවීම්වලට අදාළ වවුචර් සහිත ව ගෙවීම් වවුචරයක් ප්‍රධාන මුදල් භාරකරු වෙත ලබා දිය යුතු වේ.



## ක්‍රියාකාරකම 04

සීමිත සරසි සමාගම සුළු වියදම් ගෙවීම් සඳහා අග්‍රිම ක්‍රමයට සුළු මුදල් පොතක් පවත්වාගෙන යයි. එම ව්‍යාපාරයේ සුළු මුදල් ගනුදෙනු සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

20xx ජනවාරි 01 වන දින සුළු මුදල් භාරකරු අත ඉතිරි ව තිබූ මුදල රු. 330ක් විය. ජනවාරි මාසයේ සුළු වියදම් සඳහා රු. 1 670ක් වැය වූ බව සුළු මුදල් වවුචරයේ සටහන් ව තිබුණි.

ඉහත තොරතුරු ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

01. සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණ ද?

02. 20xx.01.31 දින ප්‍රධාන මුදල් භාරකරු විසින් ප්‍රතිපූරණය කරන ලද මුදල කොපමණ ද?

03. 20xx.02.01 දින සුළු මුදල් අග්‍රිමය රු. 500කින් වැඩි කිරීමට තීරණය කළේ නම් ප්‍රතිපූරණය කරනු ලබන වටිනාකම කොපමණ ද?

04. 20xx.03.01 දින රු. 729ක සුළු මුදල් ශේෂයක් ඉතිරි වූයේ නම් එදිනට ප්‍රතිපූරණය කළ යුතු මුදල කොපමණ ද?



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## සුළු මුදල් පොත පිළියෙල කිරීම

සුළු මුදල් ගෙවීම් ලෙජරයට පිටපත් කිරීම පහසු වීම සඳහා ඒ ඒ ගෙවීම් වර්ගය වෙනුවෙන් තීරු සහිත ව එය පිළියෙල කිරීම සිදු කෙරේ. ඒ ඒ වර්ගයේ ගනුදෙනුවල එකතුව අදාළ ගිණුමට පිටපත් කළ හැකි වන සේ එක සමාන වර්ගයේ වියදම් පිටපත් කිරීම සඳහා වෙන වෙන ම තීරු තබා ගනී. එම තීරු විශ්ලේෂණ තීරු ලෙස හැඳින් වේ.

**නිදසුන් ඃ-**

මුද්දර ගාස්තු, ලිපි ලියාපදිංචි කිරීමේ ගාස්තු, ලියුම් කවර මිලදී ගැනීමේ වියදම් යනා දී සමාන වර්ගයේ වියදම් හඳුනාගෙන ඒවා තැපැල් වියදම් නමින් වූ විශ්ලේෂණ තීරුවට ඇතුළත් කිරීම.

එසේ විශ්ලේෂණ තීරුවකට ඇතුළත් කළ නොහැකි විවිධ වර්ගවල සුළු වටිනාකම්වලින් යුතු ගෙවීම් සටහන් කිරීම සඳහා ඒවා විවිධ නැමැති විශ්ලේෂණ තීරුවකට ඇතුළත් කළ හැකි ය. අනෙකුත් විශ්ලේෂණ තීරුවල සටහන් කළ නොහැකි නමුත් වෙන වෙනම අදාළ ගිණුම්වලට පිටපත් කළ යුතු අගයන් වෙනත් ලෙජර් ගිණුම් තීරුවේ සටහන් කරනු ලැබේ.

**නිදසුන් ඃ-**

ණය හිමියන්ට ගෙවීම්, සුළු වටිනාකම් සහිත වත්කම් මිලට ගැනීම

පහත දැක්වෙන ආකෘතිය නිරීක්ෂණය කරන්න.

සුළු මුදල් පොත

| ලැබීම් (රු.) | මුදල් පොතේ ස.පි. | දිනය | විස්තරය | ව. අ. | ගෙවීම් | විශ්ලේෂණය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ලිපි ද්‍රව්‍ය | තැපැල් | ගමන් වියදම් | විවිධ වියදම් | වෙනත් ලෙජර ගිණුම් |
| | | | | | | | | | | |

මුදල් පොත මෙන් ම සුළු මුදල් පොත ද ද්විත්ව කාර්යයක් ඉටු කරයි. ඒ අනුව මූලික සටහන් පොතකින් ඉටුවන කාර්යය සහ ගිණුමකින් ඉටුවන කාර්යය යන දෙක ම සුළු මුදල් පොත තුළින් ඉටු වේ.

- සුළු මුදල් අග්‍රිමය ලැබීම් හා සුළු මුදල් ගෙවීම් ප්‍රථම වරට සුළු මුදල් පොතේ සටහන් කරන නිසා මූලික සටහන් පොතක කාර්යභාරය ඉටුවේ.



- සුළු මුදල් පොතේ ද හර සහ බැර ලෙස පැති දෙකක් පවතින නිසා වත්කම් ගිණුම් පිළිබඳ ද්විත්ව සටහන් රීතියට අනුව සටහන් තැබීමත් සිදුවේ. එමගින් ගිණුමක කාර්යය ඉටු වේ.

**සුළු මුදල් සටහන් තැබීම පිළිබඳ ද්විත්ව සටහන් තබනුයේ පහත සඳහන් පරිදි ය.**

සුළු මුදල් අග්‍රිමය ලැබෙන විට හා ප්‍රතිපූර්ණය කෙරෙන විට

| | |
|---|---|
| සුළු මුදල් පොත | හර |
| මුදල් පොත | බැර |

සුළු මුදල් පොතේ බැර කර ඇති ගෙවීම් අදළ ගිණුම්වලට හර කළ යුතු ය. මෙහි දී ඒ ඒ විශ්ලේෂණ තීරුවල එකතු අදළ ගිණුමට පිටපත් කළ යුතු ය.

ඒ අනුව විශ්ලේෂණ තීරුවල එකතුවලට අදාළ ද්විත්ව සටහන වනුයේ

| | |
|---|---|
| අදළ වියදම් ගිණුම් | හර |
| සුළු මුදල් පොත | බැර |

වෙනත් ලෙජර් ගිණුම් තීරුවේ ලියා ඇති අගය වෙන වෙන ම ගෙන අදළ ගිණුම්වලට හර කළ යුතු ය.

කාලසීමාව අවසානයේ දී සුළු මුදල් පොත තුලනය කරන විට, එහි හර පැත්තේ එකතුව, බැර පැත්තේ එකතුව තීරුවේ සටහන් කර, වෙනස ශේෂයක් ලෙස ඉදිරියට රැගෙන ආයුතු වේ.

**නිදසුන :-**

නෙත්මිගේ ව්‍යාපාරයේ 20XX මාර්තු මාසයේ සිදු කරන ලද සුළු මුදල් ගෙවීම්වලට අදාළ තොරතුරු පහත දක්වේ.

සුළු මුදල් අග්‍රිමය රු.2 000ක් වූ අතර 20XX.03.01 දින එම මුදල ලැබී ඇත.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| දිනය | ව. අ. | විස්තරය | |
|---|---|---|---|
| | | | රු. |
| 20XX.03.04 | 01 | තැපැල් ගාස්තුව | 120 |
| 03.05 | 02 | ගමන් වියදම් | 160 |
| 03.08 | 03 | සංග්‍රහ වියදම් | 260 |
| 03.10 | 04 | මුද්දර සඳහා | 140 |
| 03.15 | 05 | ගමන් වියදම් | 60 |
| 03.18 | 06 | විමුක්තිට | 200 |
| 03.22 | 07 | ත්‍රී රෝද රථ ගාස්තු | 240 |
| 03.25 | 08 | ගෙන ඒමේ කුලී | 200 |
| 03.26 | 09 | සංග්‍රහ වියදම් | 180 |
| 03.28 | 10 | පෑන්, පැන්සල් | 150 |
| 03.30 | 11 | පිරිසිදු කිරීමේ වියදම් | 200 |
| 04.01 | | වියදම් ප්‍රතිපූරණය කිරීම | |

තැපැල් ගාස්තු, ගමන් වියදම්, සංග්‍රහ වියදම්, විවිධ වියදම් සහ අනෙකුත් ලෙජර් ගිණුම් යන විශ්ලේෂණ තීරු යටතේ සුළු මුදල් පොත පිළියෙල කරන අන්දම හා ලෙජර් ගිණුම්වලට පිටපත් කරන ආකාරය පහත දක්වේ.

හර සුළු මුදල් පොත බැර

| ලැබීම් රු. | ස. පි. | දිනය | විස්තරය | ව. අ. | ගෙවීම් රු. | විශ්ලේෂණය | | | | | ලෙ. පි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | තැපැල් රු. | ගමන් වියදම් රු. | සංග්‍රහ රු. | විවිධ වියදම් රු. | ලෙජර ගිණුම රු. | |
| 2 000 | | 20XX.03.01 | මුදල් | | | | | | | | |
| | | 03.04 | තැපැල් ගාස්තු | 1 | 120 | 120 | | | | | |
| | | 03.05 | ගමන් වියදම් | 2 | 160 | | 160 | | | | |
| | | 03.08 | සංග්‍රහ ගාස්තු | 3 | 260 | | | 260 | | | |
| | | 03.10 | මුද්දර | 4 | 140 | 140 | | | | | |
| | | 03.15 | ගමන් වියදම් | 5 | 60 | | 60 | | | | |
| | | 03.18 | විමුක්ති | 6 | 200 | | | | | 200 | 12 |
| | | 03.22 | ත්‍රී රෝද රථ ගාස්තු | 7 | 240 | | 240 | | | | |
| | | 03.25 | ගෙන ඒමේ කුලී | 8 | 200 | | | | | 200 | 13 |
| | | 03.26 | සංග්‍රහ වියදම් | 9 | 180 | | | 180 | | | |
| | | 03.28 | පෑන්, පැන්සල් | 10 | 150 | | | | 150 | | |
| | | 03.30 | පිරිසදු කිරීම් | 11 | 200 | | | | 200 | | |
| | | | | | 1 910 | 260 | 460 | 440 | 350 | 400 | |
| | | 03.31 | ශේෂය ප/ගෙ | | 90 | ලෙ.පි. | ලෙ.පි. | ලෙ.පි. | ලෙ.පි. | | |
| 2 000 | | | | | 2 000 | | | | | | |
| 90 | | 04.01 | ශේෂය ඉ/ගෙ | | | | | | | | |
| 1 910 | | 04.01 | මුදල් | | | | | | | | |

හර මුදල් පොත බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.03.01 | සුළු මුදල් | 01 | 2 000 |
| | | | | 04.01 | සුළු මුදල් | 01 | 1 910 |

හර තැපැල් ගාස්තු ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | සුළු මුදල් | 01 | 260 | | | | |

හර ගමන් වියදම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | සුළු මුදල් | 01 | 460 | | | | |

හර සංග්‍රහ වියදම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | සුළු මුදල් | 01 | 440 | | | | |

හර විවිධ වියදම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | සුළු මුදල් | 01 | 350 | | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර | විමුක්ති | බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | සුළු මුදල් | 01 | 200 | | | | |

හර | ගෙන ඒමේ කුලී | බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.03.31 | සුළු මුදල් | 01 | 200 | | | | |



## ක්‍රියාකාරකම 05

හරිණිගේ ව්‍යාපාරයේ තොරතුරු පහත දැක්වේ.

- සුළු මුදල් අග්‍රිමය රු. 3 000 කි.
- 20XX ජනවාරි මාසයේ සුළු මුදල් ගෙවීම් වල එකතුව රු. 2 400 කි.
- 20XX පෙබරවාරි 01 වන දින හා 20XX මාර්තු 01 දින සුළු වියදම් ප්‍රතිපූර්ණය සිදු විය.

20XX පෙබරවාරි මාසයේ සුළු මුදල් ගෙවීම් පහත පරිදි වේ.

| දිනය | විස්තරය | රු. |
|---|---|---|
| 20XX.02.03 | ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම | 60 |
| 20XX.02.05 | ගමන් ගාස්තු | 125 |
| 20XX.02.08 | පෑන් දෙකක් මිලට ගැනීම | 40 |
| 20XX.02.12 | ත්‍රීවීල් කුලිය | 300 |
| 20XX.02.15 | සබන් කැට දෙකක් මිලට ගැනීම | 60 |
| 20XX.02.18 | හාෆ්ෂීට් ගැනීමට | 250 |
| 20XX.02.23 | පිරිසිදු කිරීමේ වියදම් | 150 |
| 20XX.02.24 | සංග්‍රහ වියදම් | 350 |
| 20XX.02.25 | සිසිල් බීම සඳහා | 220 |
| 20XX.02.26 | බස් ගාස්තු | 170 |
| 20XX.02.27 | විරාන් ට ගෙව්වා | 500 |

**අවශ්‍ය වන්නේ,**

01. වියදම් ශීර්ෂ 04කට සීමාවන පරිදි අග්‍රිම ක්‍රමයේ සුළු මුදල් පොත පිළියෙල කර 20XX.02.28 දිනට තුලනය කිරීම

02. ලෙජර ගිණුම් පිළියෙල කිරීම